
# ව්‍යවස්ථාව

**01. පක්ෂයේ නම** : **ලංකා ජනතා පක්ෂය**
லங்கா மக்கள் கட்சி
**Lanka Janatha Party**

02. **පක්ෂයේ ලකුණ** : "දියමන්තිය"



**03. පක්ෂයේ පාට** : "තද කහ"

04. **පදනම** :
සමාජවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන යහපත් සාධාරණ සමානාත්මතාවය.

05. **මූලික ප්‍රතිපත්ති** :
ජාතික ධනය, ජාතික සම්පත්, රාජ්‍ය සේවය, රාජ්‍ය සුබසාධනය, සහ මූලික මිනිස් අයිතිවාසිකම් සාධාරණව බෙදිදීම ලබා දීම. හෙවත් පංචවිධ ප්‍රතිපත්තයයි. (බලය බෙදීමකින් තොර ඒකීය රට යන සංකල්පය තුල)

06. **දර්ශණය** :
යථාර්ථවාදී බව, සත්‍යවාදී බව, අව්‍යාජබව බව, විද්‍යාත්මක බව නොහොත් සද්දහමේ හරයට අනුව දැකීම.

07. **පක්ෂයේ ප්‍රතිඥාව** :

දෙස් විදෙස් අභියෝග හමුවේ සිංහල ජාතියත්, බෞද්ධයාත්, සමස්ථ ශ්‍රී ලාංකික ජනතාවත් අනතුරකට ලක්ව ඇති මොහොතක කොන්දේසි විරහිතව පක්ෂයේ ප්‍රතිපත්ති හා අරමුණු, පටු ආත්මාර්ථයන් උදෙසා පාවා නොදෙමින් රට, ජාතිය, සමය උදෙසා මාගේ මෙහෙවර හැකි උපරිමයෙන් ඉටු කිරිමට හෘද සාක්ෂිය අභිමුවේ දී ප්‍රතිඥා දෙමි.

**08. පක්ෂයේ අරමුණු** :

i. නිෂ්පාදිත ආර්ථිකයක් නිර්මානය කරමින් ඒ මත විස්වාසය තබමින් රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාමාර්ග ගැනීම
ii. දේශීය නිෂ්පාදන ක්‍රියාවලියට නව පනක් ලබාදී නිෂ්පාදිත ආර්ථිකය තුලින් සංවර්ධිත රටක් නිර්මානය කිරීම. ණය බරින් සම්පූර්ණයෙන් මිදීම.
iii. සිංහල ජාතියේ හා බෞද්ධ ශාසනයේ ආරක්ෂකයා ලෙස ක්‍රියා කිරීමත් සමස්ථ ශ්‍රී ලාංකික ජනතාවගේ අයිතිය වෙනුනේ පෙනී සිටීම.
iv. ජාතික අනන්‍යතාවය හා උරුමයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනි සිටීම.
v. භේද නැති ශ්‍රී ලංකාවක් හා සුරක්ෂිත, සාමකාමී රටක් නිර්මානය කිරීම.
vi. දේශීය කෘෂි කර්මාන්තය නගා සිටුවමින් ස්ථාවර හා ස්වයං පෝෂිත රටක් බිහිකිරීම.
vii. එකම රටක් එකම නීතියක් තුල රට පාලනය කිරීම.
viii. ධාර්මිෂ්ඨ රටක් නිර්මානය කිරීම.

මහලේකම්
ශාලික ලක්ප්‍රිය පෙරේරා
ලංකා ජනතා පක්ෂය

## 09. පක්ෂයේ ව්‍යුහය

i. උත්තරීතර මණ්ඩලය (විධායක සභාව)
ii. දේශපාලන මණ්ඩලය
iii. දිස්ත්‍රික් සංවිධාන
iv. ආසන බල මණ්ඩල
v. කොට්ඨාස බල මණ්ඩල
vi. කාන්තා සංවිධානය
vii. වෘත්තීය සමිති එකමුතුව
viii. වෘත්තිකයන්ගේ එකමුතුව
ix. පරිසර කමිටුව
x. තරුණ සංවිධානය
xi. ජාත්‍යන්තර ශාඛාවන්

## 10. උත්තරීතර මණ්ඩලයේ සංයුතිය

i. සාමාජික සංඛ්‍යාව 17ක් වන්නේය. එක් අයෙක් කාන්තා සාමාජිකාවක් විය යුතුය.
ii. නිල කාලය වසර 02 කි.
iii. සභාපති හා ලේකම්ගේ හැර.
iv. එක් පුද්ගලයෙකුට හිමි වනුයේ එක් ඡන්දයකි.
v. මුලසුන පක්ෂ නායකයා ගනු ලබයි.
vi. පක්ෂ නායකයා නොමැති විට ජ්‍යේෂ්ඨ උප සභාපති තුමා මුලසුන හොබවයි.
vii. සෑම විටම රැස්වීමට නම් සනපූර්ණය තිබිය යුතුය. (සනපූර්ණය අවම සාමාජිකයන් 10ක් සිටිය යුතුය.)

## 11. උත්තරීතර මණ්ඩලයේ නිලදාරි මණ්ඩලය (විධායක සභාව)

i. සභාපති / පක්ෂ නායක (පක්ෂ සභාපති පක්ෂ නායකයාද වේ)
ii. මහ ලේකම්
iii. උප සභාපති (ජ්‍යේෂ්ඨ)
iv. භාණ්ඩාගාරික
v. ජාතික සංවිධායක
vi. ප්‍රචාරක ලේකම්
vii. මාධ්‍ය ලේකම්
viii. විදේශ ලේකම්
ix. පරිපාලන ලේකම්
x. කාන්තා කටයුතු ලේකම්
xi. නීතී උපදේශක
xii. කාරක සභිකයන් 06 දෙනකි

## 12. උත්තරීතර හෙවත් විධායක සභාවේ කාර්යයන් හා වගකීම්

i. සාමාජික සංඛ්‍යාව 17 කි.
ii. පක්ෂයේ සියළුම දේශපාලන, පරිපාලන හා සියළුම තින්දු තීරණ ගන්නා ඉහලම මණ්ඩලයයි.
iii. සියළු සාමාජිකයින් හා නිලදාරීන් පත්කිරීමේ හා ඉවත් කිරීමේ බලය පක්ෂ නායකයාට අමතරව, බලය හිමි මණ්ඩලයයි.
iv. පක්ෂයේ සාමාජිකයෙකු, වෙනත් කමිටු හා දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු මෙහි බහුතර කැමැත්තෙන් ඉවත් කිරීමට හෝ පක්ෂ නායකයාගේ අනුමැතියෙන් පත්කිරීමට හැක.
v. උත්තරීතර මණ්ඩලයේ සාමාපිකයෙකු ඉවත් කල හැක්කේ මෙහි 2/3 කැමැත්තෙනි.

vi. පක්ෂයේ මහ ලේකම්වරයා ඉවත් කිරීමට උත්තරීතර මණ්ඩලයේ 15/17 දෙනෙකුගේ කැමැත්තක් අවශ්‍ය වේ. එසේ ඉවත් කිරීමක් සිදුවුවහොත් විධායක සභාවේ 2/3 ක කැමැත්තෙන් අලුතින් ලේකම්වරයෙක් පත්කර ගත හැකිය.
vii. පක්ෂයේ නායකයා/සභාපතිවරයා ඉවත් කිරීමට උත්තරිතර මණ්ඩලයේ 15/17 දෙනෙකුගේ කැමැත්තක් අවශ්‍ය වේ.
viii. උත්තරිතර මණ්ඩලය අලුතින් පත් කිරීමේ බලය පක්ෂ නායකයාට හිමිවෙයි.
ix. උත්තරිතර මණ්ඩලය කැඳවීම පක්ෂ නායකයාගේ උපදෙස් පරිදි පක්ෂ මහ ලේකම් විසින් සිදුකල යුතුය.
x. පක්ෂ නායකයා ඉවත් වූවිට, මිය ගියවිට හෝ ඉවත් කිරීමක් සිදුවුවහොත් විධායක සභාවේ 2/3 ක කැමැත්තෙන් අලුතන් නායකයෙකු පත්කර ගත හැකිය.
xi. විධායක සභාවේ 2/3 ක තීරණය කරනුයේ නොපැමිණි සාමාජිකයන් ඇතුලත්ව එනම් සම්පූර්ණ 17 දෙනාගෙනි. එනම් 12 දෙනෙකුගේ කැමැත්ත අනිවාර්යය වේ.
xii. පක්ෂයේ ව්‍යවස්ථාව වෙනස් කිරීම හෝ සංශෝධන කිරීමට නම් උත්තරීතර මණ්ඩලයේ 2/3 කැමැත්තක් අවශ්‍ය වේ. (12, vi හා vii ට මෙය අදාල නැත.)
xiii. පිට පිට තුන්වරක් විධායක සභාවට යම් සාමාජිකයෙකු නොපැමිණියොහොත් ඔහුගේ සාමාජිකත්වය අහෝසි වෙයි.
xiv. රැස්වීමට නොපැමිණෙන්නේ නම් ලේකම්වරයාට අන්වාර්යෙන් දැනම්දිය යුතුයි.

**13. දේශපාලන මණ්ඩලය**

i. සාමාජික සංඛ්‍යාව 25.
ii. පක්ෂයේ නායක, මහලේකම්, ජාතික සංවිධායක, ඇතුළුව උත්තරිතර මණ්ඩලය බහුතර එකඟතාවයෙන් පත්කල සාමාජිකයින් 05 දෙනා සමග.
iii. නිල කාලය වසර 02 කි.
iv. උත්තරීතර මණ්ඩලය බහුතර එකඟතාවයෙන් පත්කල සාමාජිකයින් 20 දෙනා සමග.
v. පක්ෂය නියෝජනය කොට පාර්ලිමේන්තු නියෝජනය කරන මන්ත්‍රීවරුන් මෙහි අනිවාර්යයෙන් සාමාජිකයන් වන්නේය. සාමාජික සංඛ්‍යාව මෙහිදී වැඩිවිය හැක.
vi. උත්තරීතර මණ්ඩලය බහුතර එකඟතාවයෙන් දේශපාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු ඉවත් කල හැක.

**14. දිස්ත්‍රික් සංවිධාන**

i. සාමාජික සංඛ්‍යාව 25 කි.
පක්ෂ නායකයා, මහලේකම්, ජාතික සංවිධායක හා විධායක සභිකයන් 5 හැර
ii. පක්ෂ නායකයා, ලේකම්, ජාතික සංවිධායක හා භාණ්ඩාගාරික අනිවාර්යයෙන් සාමාජිකයින් වේ.
iii. දිස්ත්‍රික් සංවිධායකයින් අනිවාර්යයෙන් දිස්ත්‍රික් කමිටුවේ සභාපති වේ.
iv. දිස්ත්‍රික් සංවිධායකයින් පත්කරනුයේ පක්ෂයේ නායකයා විසිනි.
v. දිස්ත්‍රික් සංවිධායකයින් ඉවත් කිරීමේ බලය පක්ෂයේ නායකයා සතුය.

**15. ආසන බලමණ්ඩල**

i. බලමණ්ඩලයක නිලධාරී සංඛ්‍යාව 15 කි.
ii. සෑම මැතිවරණ බල ප්‍රදේශයකට එක බැගින් තිබිය හැක.
iii. සාමාජික සංඛ්‍යාව උපරිමයකි.
iv. ආසන සංවිධායක නිල බලයෙන් මෙහි සභාපති වේ.
v. ආසන සංවිධායක පත්කරනුයේ පක්ෂ නායකයාගේ අනුමැතියෙන් ජාතික සංවිධායක විසිනි.
vi. පක්ෂ නායකයාට ඕනෑම මොහොතක ආසන සංවිධායකයින් ඉවත් කලහැක.

..............................
මහලේකම්
ශාලිකා ලක්ප්‍රිය පෙරේරා
ලංකා ජනතා පක්ෂය

## 16. කොට්ඨාස බලමණ්ඩල

i. බලමණ්ඩලයක නිලදාරී සංඛ්‍යාව 12 කි
ii. සෑම කොට්ඨාස බල ප්‍රදේශයකට එක බැගින් තිබිය හැක.
iii. සාමාජික සංඛ්‍යාව උපරිමයකි.
iv. කොට්ඨාස සංවිධායක නිල බලයෙන් සභාපති වේ.
v. කොට්ඨාස සංවිධායක පත්කරනුයේ දිස්ත්‍රික් නායකයාගේ අනුමැතියෙන් ආසන සංවිධායක විසනි.
vi. පක්ෂ නායකයාට ඕනෑම මොහොතක කොට්ඨාස සංවිධායකයින් ඉවත් කල හැක.

## 17. කාන්තා බලමණ්ඩලය

i. බලමණ්ඩලයේ නිලදාරී සංඛ්‍යාව 15 කි.
ii. පක්ෂයේ කාන්තා කටයුතු ලේකම් මෙහි සභාපතිනිය වේ.
iii. සාමාජික සංඛාව උපරිම වේ.
iv. නිලදාරීන් පත්කිරීමේ බලය සභාපතිනිය සතුවේ.
v. මෙහි ඕනෑම නිලදාරී කෙනෙක් ඉවත් කිරීමෙ බලය පක්ෂ නායකයාට හිමිවේ.

## 18. පක්ෂ නායකයාගේ බලතල

i. පක්ෂයේ සභාපති, පක්ෂ නායකයා වන්නේය.
ii. පක්ෂයේ සියළුම රැස්වීම වල මුලසුන හෙබවිය යුතුය.
iii. සියළු පරිපාලන තීරණවල අවසාන බලය හිමිවේ.
iv. දේශපාලන මණ්ඩල, ආසන හා කොට්ඨාස වල නිලදාරීන් හා සාමාජිකයින් පත්කිරීමට හා ඉවත් කිරිමේ බලය හිමිවේ.
v. වෙනත් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා හා අවබෝධතාවයන් පිළිබඳ තීරණය ගැනීමේ බලය හිමිවේ. උත්තරීතර මණ්ඩලයේ 3/2ක් ලබාගෙන ක්‍රියාත්මක කල යුතුය.

## 19. පක්ෂ මහ ලේකම්ගේ බලතල හා කාර්යභාරයන්

i. පක්ෂයේ සියළු ලිපි ලේඛණ ලඟ තබාගැනීම හා සුරක්ෂිතභාවය ඔහු සතු කාර්යයකි.
ii. පක්ෂයේ සියළු නාම ලේඛණ ලඟ තබාගැනීම හා සුරක්ෂිතභාවය ඔහු සතු කාර්යයකි.
iii. පක්ෂයේ දේශපාන, පරිපාලන කටයුතු වෙනුවෙන් ලිපි සකස් කිරීම හා අත්සන් කිරිම ඔහු සතු කාර්යයකි.
iv. පක්ෂය වෙනුවෙන් මැතිවරණ කොමිසම නියෝජනය කිරීමේ වගකීමද මොහු සතු කාර්යයකි.
v. පක්ෂයේ සභාපති නොමැති විට, ඉවත් වූ විට සභාපතිගේ සියලු බලතල ක්‍රියාත්මක කිරීම මොහු සතු කාර්යයකි.
vi. පක්ෂය වෙනුවෙන් සියළු පත්වීම්, ගිවිසුම් හා ඕනෑම ලිපියක අත්සන යෙදීම මොහු සතු වගකීමක් හා කාර්යයකි.

## 20. පක්ෂ භාණ්ඩාගාරිකගේ බලතල හා කාර්යභාරයන්

i. පක්ෂය වෙනුවෙන් මුදල් රැස්කිරීමේ බලය හිමිවේ.
ii. පක්ෂයේ සියළු සංවිධාන හා සාමාජිකයන් රැස්කරන මුදල් එකතු කොට පක්ෂ ගිණුමේ තැන්පත් කිරීම භාණ්ඩාගාරික සතු වගකීමයි.
iii. සාමාජික මුදල් හා අරමුදල් කළමනාකරණය කිරීම භාණ්ඩාගාරික සතු වගකීමයි.
iv. පක්ෂයේ වර්තමාන මූල්‍ය තත්වය සෑම උත්තරීතර මණ්ඩල රැස්වීමකට ඉදිරිපත් කල යුතුය.
v. වාර්ෂික අය වැය වාර්ථාව පක්ෂයේ උත්තරීතර මණ්ඩලයේ අනුමැතියට යටත්ව මහා සභා රැස්වීමට ඉදිරිපත් කල යුතුය.
vi. පක්ෂය වෙනුවෙන් මුදල් රැස්කිරීමේ දී ලැබෙන සියලු මුදල් බැංකු ගත කල යුතුය. පක්ෂයේ මූල්‍ය කටයුතු මූල්‍ය නීති වලට අනුකුලව මූල්‍ය කටයුතු සිදුකල යුතුය.

## 20.1. පක්ෂයේ මූල්‍ය කටයුතු

i. උත්තරීතර මණ්ඩලයේ බහුතර අනුමැතියෙන් අනුමත කල බැංකු ගිණුම් ආරම්භ කිරීම පවත්වා ගෙන යාම කල යුතු වේ.
ii. පක්ෂයේ තැන්පත් මුදල් නැවත ලබාගැනීමේදී භාණ්ඩාගාරික, ලේකම් හෝ පක්ෂයේ සභාපති යන අයගෙන් දෙදෙනෙකුගේ අත්සන අනිවාර්යය වේ.
iii. පක්ෂයේ තැන්පත් මුදල් රු.ලක්ෂ 10 කට වඩා නැවත ලබාගැනීමේදී භාණ්ඩාගාරික සමග පක්ෂයේ සභාපති හා ලේකම්ගේ අත්සන අනිවාර්යය වේ.
iv. සියළු වියදම් වෙනුවෙන් ලදුපතක් ලබා ලඟ තබාගත යුතු අතර සියළු ලැබීම වලදී රිසිට් පතක් ලබා දිය යුතුය.
v. විධායක සභාවේ අනුමැතියට ඇතිව රු 50000 ක උපරිමයකට යටත්ව එදිනෙදා වියදම් මුදලක් සුළු මුදල් ලෙස අතැතිව තබා ගත හැක
vi. සියළු රු.50,000 ට වැඩි වියදම වෙනුවෙන් පක්ෂ නායකයාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ. පක්ෂ නායකයා නොමැති විට පක්ෂ ලේකම්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ.
vii. ඊට අඩු වියදම් හා ලැබීම් සඳහා භාණ්ඩාගාරික තුමාගේ අත්සන ප්‍රමාණවත්ය.
viii. පක්ෂයේ සියලු වියදම් විධායක සභාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය.

## 21. පක්ෂ උප සභාපතිගේ බලතල හා කාර්යය භාරයන්

i. පක්ෂයේ නායකතුමා නැති අවස්ථා වලදී සෑම රැස්වීමක්ම මෙහෙය වීමේ වගකීම ඔහු සතුය.
ii. පක්ෂයේ අවශ්‍යතාවය මත උත්තරීතර මණ්ඩලයේ බහුතර කැමැත්තෙන් සම්මාන උප සභාපතිවරු ඕනෑම සංඛ්‍යාවක් පත්කල හැක. එහෙත් ඔවුනට උත්තරීතර මණ්ඩලයේ ඡන්ද බලය හිමි නොවේ.
iii. විධායක සභාව නියෝජනය කරනුයේ ජ්‍යේෂ්ඨ උප සභාපති පමණි
iv. දේශපාලන මණ්ඩලයේ සාමාජිකත්වය පමණක් හිමිවේ.

## 22. ජාතික සංවිධායකගේ බලතල හා කාර්යය භාරයන්

i. පක්ෂයේ ආසන හා කොට්ඨාස බල මණ්ඩල වල සංවිධායකයින් පත් කිරීමේ බලය සතුය.
ii. පක්ෂයේ සංවිධාන කටයුතු හා ප්‍රවර්ධනයට කටයුතු කිරීම ඔහුගේ වගකීම වේ.
iii. පක්ෂයේ ආසන හා කොට්ඨාස බල මණ්ඩල වල සංවිධායකයින් පත් කිරීමේදී පක්ෂයේ සභාපතිගේ හා පක්ෂයේ මහලේකම් තුමාගේ අනුමැතිය ඇතිව සියළු සංවිධායකයින් පත් කිරීමේ බලය කලයුතුවේ.
iv. නිරන්තරයෙන් පක්ෂයේ ආසන හා කොට්ඨාස බල මණ්ඩල වල සංවිධායකයින් සමග පක්ෂයේ සංවිධාන කටයුතු හා ප්‍රවර්ධනයට කටයුතු කිරීම ඔහුගේ වගකීම වේ.

## 23. ප්‍රචාරක ලේකම්ගේ බලතල හා කාර්යය භාරයන්

1. පක්ෂයේ ප්‍රචාරක යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරිමේදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම.
2. පෝස්ටර්, බැනර් හා කටවුට් ආදි ප්‍රචාරක වැඩකටයුතු වලදී පක්ෂයේ ලේකම් හෝ සභාපතිගේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කිරීම.
3. පක්ෂයේ සමාජ මාධ්‍ය හා වෙබ් අඩවි වල ප්‍රධාන මෙහෙයුම් භාරව ක්‍රියා කල යුතු අතර ඒවායේ පූර්ණ වගකිම ප්‍රචාරක ලේකම්ගේ කාර්යය භාරයකි.
4. මැතිවරණයකදී පක්ෂයේ ප්‍රචාරක යාන්ත්‍රණයේ මෙහෙයුම් ප්‍රධානියා වේ.

මහලේකම්
ශාලික ලක්ප්‍රිය පෙරේරා
ලංකා ජනතා පක්ෂය

## 24. මධ්‍ය ලේකම්ගේ බලතල හා කාර්යය භාරයන්

i. පක්ෂයේ මාධ්‍ය හමු ක්‍රියත්මක කිරීමේදි මූලිකත්වය ගෙන කටයුතු කිරීම.
ii. විද්‍යුත් හා අනිකුත් ජනමාධ්‍ය ආදි ප්‍රචාරක වැඩකටයුතු වලදි පක්ෂය් ලේකම් හෝ සභාපතිගේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කරීම.
iii. පක්ෂයේ ප්‍රවෘත්ති හා මාධ්‍ය නිවේදන නිකුත් කිරීමේදී මූලිකත්වය ගෙන කටයුතු කිරීම.
iv. විද්‍යුත් හා අනිකුත් ජනමාධ්‍ය ආදි ප්‍රචාරක වැඩකටයුතු වලදි පක්ෂයේ ලේකම් හෝ සභාපතිගේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කිරීම.

## 25. පරිපාලන ලේකම්ගේ බලතල හා කාර්යය භාරයන්

i. පක්ෂයේ සේවය කරන සේවකයින්ගේ සියලු පරිපාලන කටයුතු කිරීම.
ii. පක්ෂයේ කාර්යාලයේ සේවකයින් හා පක්ෂයේ වත්කම් (මුදල් හැර) පිළිබඳව වගකීම හා නඩත්තු කටයුතු පිළිබඳව වගකීම පරිපාලන ලේකම් සතුය.
iii. මෙම වත්කම් පරිපාලනයේදී පක්ෂ ලේකම්ගේ හෝ සභාපතිගේ අනුමැතිය අනිවාර්ය වේ.
iv. පක්ෂයේ සියලු සංවිධායකයින් හා සාමාජිකයින්ගේ අදාල තොරතුරු ලිපි ලේඛණ නියමිත පරිදි එක්රැස් කොට පක්ෂයේ ලේකම් වෙත ලබා දීමට කටයුතු කලයුතු වේ.
v. පක්ෂයේ ප්‍රවර්ධනය (විධායක සභාව අනුමැතිය ගත්) කටයුතු වලදී ජාතික සංවිධායක සමග ඒ පිළිබඳ සොයා බලා කටයුතු කිරීම.

## 26. කාන්තා කටයුතු ලේකම්ගේ බලතල හා කාර්යය භාරයන්

i. පක්ෂයේ සියළු කාන්තා සංවිධාන පිළිබඳව පරිපාලන කටයුතු කිරීම.
ii. සියළු කාන්තා සංවිධාන වල මූලික ගෙන කටයුතු කිරීම.
iii. සියළු කාන්තා සංවිධාන වල නිලදාරීන් පත්කිරිම හා ඉවත් කිරීම පක්ෂ නායකයාගේ අනුමැතියට යටත්ව සිදුකල යුතුය.

## 27. විදේශ කටයුතු ලේකම්ගේ බලතල හා කාර්යය භාරයන්

i. පක්ෂයේ සියළු විදේශ රටවල සිටින සාමාජිකයින් සමග කටයුතු කිරීම .
ii. හැකි තරම් විදේශ රටවල සිටින සාමාජිකයින් පක්ෂය වෙත බඳවා ගැනීමට කටයුතු කිරීම.
iii. හැකි තරම් විදේශ රටවල පක්ෂයේ ශාඛා කාර්යාල එම රටවල් වල පිහිටුවීමට කටයුතු කිරීම හා ඔවුන් සමග නිරන්තරයෙන් සම්භන්ධතා පැවැත්වීම.
iv. ජාත්‍යන්තරයේ සිදුවන දේශපාලන විපර්යාස කාලීන සදුවීම් හා අන්තර්ජාතික දේශපාලනික බලපෑම් ආදිය පිළිබඳ තොරතරු පක්ශයේ විධායක සභාව දැනුවත් කිරීම.
v. මෙරට සිටින සියලු තානාපති වරුන්, විදෙස් නිලදාරීන් සමග කටයුතු කිරීම.
vi. තානාපති වරුන්, විදෙස් නිලදාරීන් සමග පක්ෂය වෙනුවෙන් නියෝජන කරන විට පක්ෂයේ ලේකම් හෝ සභාපතිගේ අනුමැතිය ගෙන ක්‍රියාත්මක කිරීම.

## 28. රැස්වීම් පැවැත්වීම.

vii. පක්ෂයේ සියළු දේශපාලන මණ්ඩල, ආසන බලමණ්ඩල හා කාන්තා බලමණ්ඩල සාමාජිකයන් කැඳවා වසර 2 කට වරක් පක්ෂයේ මහා සම්මේලනය පැවැත්විය යුතුය.
viii. එහිදි උත්තරිතර මණ්ඩලය අනුමත කල පක්ෂයේ නිලදාරි මණ්ඩලය ප්‍රකාශයට පත්කල යුතුය.
ix. උත්තරිතර මණ්ඩලය සෑම දෙමසකට වරක්වත් හෝ රැස්විය යුතුය.
x. දේශපාලන මණ්ඩලය සෑම තෙමසකට වරක්වත් හෝ රැස්විය යුතුය.

## 29. පක්ෂ සාමාජිකත්වය

i. පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනීමට ලේකම්වරයා වෙත අයදුම් පතක් යොමු කිරීමෙන් ලබාගත හැක.

ii. සියළු සාමාජිකයින්, පක්ෂය එම වර්ෂයේ තීරණය කරන සාමාජික ගාස්තු ගෙවා සාමාපිකත්වය ලබා ගත යුතුයි.

iii. සියළු සාමාජිකයින් වසර 2 වරක් තම සාමාජිකත්වය අලුත් කර ගත ගත යුතුයි.

iv. පක්ෂයේ සාමාජිකයින් වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබා ගතහොත් අප පක්ෂයේ සාමාජිකත්වය එදිනම අවලංගු වේ.

v. අනිකුත් සියලුම සමිති මාස 06 ට වරක් වත් රැස්විය යුතුය.

vi. මෙම සියලු රැස්වීම් පක්ෂයේ ලේකම්ගේ හෝ සභාපති තුමාගේ අනුමැතිය ඇතිව රැස්විය යුතුය.

vii. සියලු සාමාජිකයන් පක්ෂයේ විනය හා ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කල යුතුය. එසේ නොවුනහොත් පක්ෂ නායකයාට ඕනෑම කෙනෙක් ඕනෑම මොහොතක ඉවත් කල හැක. (උත්තරීතර මණ්ඩලයේ බහුතරයෙන් පත්කරන විනය මණ්ඩලයේ බහුතර එකඟතාවයෙන් පක්ෂයේ සාමාජිකයන්ගේ විනය කඩකිරීමක් කලබවට නිගමනය කල පසු)

viii. පක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙකු වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබා ගතහොත් හෝ පක්ෂයේ ප්‍රතිපත්ති වලව පටහැනිව ක්‍රියා කල බව උත්තරීතර මණ්ඩලයේ බහුතරය තීරණය කරනු ලැබුවහොත් ඔහුගේ අප පක්ෂයේ සාමාජිකත්වය හා එම මන්ත්‍රීධූරය එදිනම අවලංගු වේ.

..............................

**මහලේකම්**
**ශාලික ලක්ප්‍රිය පෙරේරා**
**ලංකා ජනතා පක්ෂය**

මහා ලේකම්

සභාපති/ පක්ෂ නායක